# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1903/11 - 2015 පෙබරවාරි මස 25 වැනි බදාදා - 2015.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : WGSWD&EIP/ACQ/KB/06.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/10/2012/LRB-22.

වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ, බෙල්ලන්විල ප්‍රදේශයේ ජල රක්ෂිතයක් නිර්මාණය කිරීම සඳහා පහත විස්තර කර ඇති ඉඩම රජයට පවරාගෙන ඇති බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

***පවරා ගන්නා ලද ඉඩමේ විස්තර* :**

කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙල්ලන්තර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති අංක 9469 හා 2014.12.19 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් අංකනය කර පෙන්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2297ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි 01.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: කණුකෙටිය කුඹුර; විස්තරය : වගුරු බිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා : වික්‍රමසිංහගේ ආරච්චිගේ ශර්මේන් ශිරෝන් පෙරේරා මිය, අංක 116/2සී, පිරිවෙන පාර, බොරලැස්ගමුව; ප්‍රමාණය: හෙක්. 0.2297.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015 අප්‍රේල් මස 08 වැනි දින පෙ.ව. 10.00 ට රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2015 අප්‍රේල් මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

සී. ඩබ්. අබේසූරිය,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2015 පෙබරවාරි මස 24 වැනි දින,
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

03-330